# BUSINESS FOUNDATION & ITS ENVIRONMENT (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව</u>

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව කිහිපයක් පහත දැක්වේ.

- අයිතිකරුවෝ /කොටස් හිමියෝ
- කළමනාකරුවෝ
- සේවකයෝ
- ණයහිමියෝ
- පාරිභෝගිකයෝ
- සැපයුම්කරුවෝ
- විභව ආයෝජකයෝ
- රජය
- ප්‍රජාව
- වෙනත් පාර්ශ්ව

# <u>ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු</u>

## <u>අයිතිකරුවෝ</u>

- තමන් ආයෝජනය කළ මුදලට ප්‍රමාණවත් ලාභයක් ලැබේ දැයි දැන ගැනීමට
- ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ ව දැන ගැනීමට
- වෙළෙඳපොළ කොටස දැන ගැනීමට

ClassWork.LK

## කළමනාකරුවෝ

- ව්‍යාපාරයේ ලාභය උපරිම කිරීමට
- ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ ව දැන ගැනීමට
- කළමනාකරණ තීරණවල සාර්ථක අසාර්ථක බව දැන ගැනීමට

## සේවකයෝ

- ඉහළ වැටුපක් ලබා ගැනීමට
- ප්‍රසාද දීමනා ලැබේ දැයි දැන ගැනීමට
- රැකියාවේ උසස්වීම් ලබා ගැනීමට

## ණයහිමියෝ

- සපයන ලද ණය මුදල් ආපසු ලබා ගැනීමේ හැකියාව දැන ගැනීමට
- ණය මුදලේ සුරක්ෂිත බව දැන ගැනීමට
- ඇප සුරැකුම්වල සුරක්ෂිත බව තහවුරු කර ගැනීමට

ClassWork.LK

**පාරිභෝගිකයෝ**

- ගුණාත්මක භාණ්ඩ හා සේවා ලබා ගැනීමට
- වගකීම් නිසි පරිදි ඉටු කරන්නේ දැයි බැලීමට
- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට

**සැපයුම්කරුවෝ**

- අඛණ්ඩ ව ඇණවුම් ලබා ගැනීමට
- සපයන ලද භාණ්ඩ සඳහා මුදල් ආපසු අයකර ගැනීමට

**විභව ආයෝජකයෝ**

- තමන් සතු සම්පත් අනාගතයේ දී එම ව්‍යාපාරයේ ආයෝජනය කිරීමට

**රජය**

- බදු අයකර ගැනීමට/බදු සහන ලබා දීමට
- සේවා නියුක්තිය වර්ධනය කිරීමට
- ආර්ථික සංවර්ධනය පිළිබඳ මැන බැලීමට

ClassWork.LK

**ප්‍රජාව**

- පරිසරය සුරැකීම පිළිබඳ ව සොයා බැලීමට
- රැකියා අවස්ථා ලබා ගැනීමට

## ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව, ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු

ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව, ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු කිහිපයක් පහත සඳහන් වේ.

| පාර්ශ්වය | ව්‍යාපාරයකට වැදගත් වීමට හේතු |
|---|---|
| අයිතිකරුවෝ | • ආයෝජන වැඩි කර ගැනීමට<br>• ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට |
| සේවකයෝ | • සේවක කාර්යක්ෂමතාව වැඩිකර ගැනීමට<br>• සේවකයන් රඳවා ගැනීමට<br>• සේවක ආකර්ශනය ලබා ගැනීමට |

ClassWorkLK

| | |
|---|---|
| ණයහිමියෝ | • අඛණ්ඩ ව අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට<br>• අඩු පිරිවැයකින් අරමුදල් සම්පාදනය කර ගැනීමට |
| රජය | • බදු සහන ලබා ගැනීමට<br>• යටිතල පහසුකම් ලබා ගැනීමට<br>• තාක්ෂණික දැනුම ලබා ගැනීමට |
| ගනුදෙනුකරුවෝ | • අදාළ භාණ්ඩ හෝ සේවා සඳහා වෙළෙඳපොළ සුරක්ෂිත කර ගැනීමට<br>• පාරිභෝගික විශ්වාසය ගොඩනගා ගැනීමට<br>• ගනුදෙනුකරුවන්ගේ පක්ෂපාතිත්වය ඇති කර ගැනීමට |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura